# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
අரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site


මගේ අංකය / எனது இல / My No: PS/GT/2021-I

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி: / Date: 2021.08.11

## රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020 මාර්ගගත ක්‍රමයට තොරතුරු ලබා ගැනීම

ඉහත වැඩසටහන යටතේ බඳවාගත් අභ්‍යාසලාභී උපාධිධාරීන් වෙතින් අත්‍යවශ්‍ය තොරතුරු කැඳවීමට තීරණය කර ඇත. ඒ සඳහා වන මාර්ගගත මෘදුකාංගයට 2021.08.13 දින සිට පහත සබැඳි (Link) මගින් ප්‍රවේශ වී (Login) ඔබගේ තොරතුරු ඇතුලත් කළ යුතු වේ.

http://43.224.125.68:7000

http://43.224.125.68:7007

http://43.224.125.68:7006

http://43.224.125.68:7009

02. මූලික අදියරේදී අභ්‍යාසලාභී නිලධාරින්ට ඉහත සබැඳියට ඇතුල් වී දත්ත ඇතුළත් කිරීමට පහසුකම් සපයා ඇති කාල පරාසය ඇමුණුම (01) මගින් දැක්වේ. අදාළ දින තුළ දී මාර්ගගත මෘදුකාංගයට ප්‍රවේශවීමට නොහැකි වන අභ්‍යාසලාභීන් සඳහා නැවත දිනයක් ලබා දීමට සැලකිය යුතු කාලයක් ගතවනු ඇත

03. රාජ්‍ය ආයතනවල පුහුණුව ලබන උපාධිධාරී අභ්‍යාසලාභීන් 60000 කට ආසන්න පිරිසකගේ තොරතුරු සමග කටයුතු කිරීමේ පහසුව සැලසෙන පරිදි මෙම කටයුත්ත සිදුකරන බැවින් සෑම අභ්‍යාසලාභී උපාධිධාරියෙකුට ම සිය තොරතුරු ඇතුළත් කිරීම සිදුකළ යුතු වේ.

**පරිශීලක නාමය (Username), මුර පදය (Password)**

- ඔබ මෙම පුහුණුව සඳහා අයදුම් කරන ලද අවස්ථාවේ දී **ඔබ විසින් ලබා දුන් ජාතික හැඳුනුම්පත් අංකය** පරිශීලක නාමය වේ.
  උදා: 791234567V හෝ 197912340567 වශයෙන්
- මුලින් REQ_ ලෙස සඳහන් කර ඔබ වෙත දැනටමත් **රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති පත්වීම් ලිපියේ සඳහන්** පත්වීම් අංකයේ අවසන් ඉලක්කම් 03 ප්‍රථමයෙන්ද, ඔබ විසින් ඉහත පරිශීලක නාමය ලෙස සඳහන් කර ජාතික හැඳුනුම්පත් අංකයේ අවසාන අංක 03 දෙවනුව ද ගත් විට ඔබගේ මුර පදය සෑදේ.

**උදා:-** පත්වීම් අංකය: COL-01-00210
ජා.හැ.අං : 791234567v
**මුර පදය: REQ_210567**

- අයදුම්පත පිරවීමේ දී සිංහල/දෙමළ අත්අකුරු යතුරු ලියනය කිරීමේ දී Unicode Font භාවිතා කරන්න

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

අත්/කළේ : ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

# රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020
## අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත

| අනු අංකය | නියමිත දිනය | දත්ත ඇතුළත් කළ හැකි අදාළ පත්වීම් අංක |
|---|---|---|
| 1 | 13 - අගෝස්තු - 21 | COL-01-00002 - COL-01-01207 |
| 2 | 14 - අගෝස්තු - 21 | COL-01-01208 - COL-01-02528 |
| 3 | 16 - අගෝස්තු - 21 | COL-01-02529 - COL-01-04034 |
| 4 | 17 - අගෝස්තු - 21 | COL-01-04035 - COL-01-04504<br>GAM-02-00001 - GAM-02-00642 |
| 5 | 18 - අගෝස්තු - 21 | GAM-02-00643 - GAM-02-01920 |
| 6 | 19 - අගෝස්තු - 21 | GAM-02-01921 - GAM-02-03191 |
| 7 | 20 - අගෝස්තු - 21 | GAM-02-03192 - GAM-02-04484 |
| 8 | 21 - අගෝස්තු - 21 | GAM-02-04486 - GAM-02-05819 |

**සැ.යු :-**

01 නිවේදනයේ අංක 02 යටතේ සඳහන් මාර්ගගත මෘදුකාංගයට ප්‍රවේශ වී දත්ත ඇතුළත් කිරීමේ සබැඳි (Links) භාවිත කිරීමේ දී ඇමුණුමහි සඳහන් දිනට නියමිත ප්‍රමාණයට පමණක් පහසුකම් සලසා ඇත. දිනට නියමිත මුල් අංක 250 දක්වා පළමු සබැඳිය ද (Link), 251 – 500 දක්වා දෙවන සබැඳිය ද, 501 – 750 දක්වා තෙවන සබැඳිය සහ 751 – 1000 දක්වා සිව්වන සබැඳිය ද තෝරා ගැනීමෙන් ප්‍රවේශ වීමේ අවහිරතාව අවම කරගත හැකිය

02. දත්ත ඇතුළත් කිරීම සඳහා සෙසු අභ්‍යාසලාභී නිලධාරීන්ට ඉඩ සලසනු ලබන කාල සීමාව මෙම අදියරේ ප්‍රගතිය සලකා බලා නොපමාව නිවේදනය කරනු ලැබේ.

**<u>විමසීම්</u>**

අභ්‍යාසලාභී උපාධිධාරී ශාඛාව - 0112696068

- 0715253192